**ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල - 2020**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 61 වගන්තිය යටතේ සාදන ලද 1994 අංක 01 දරන ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ නියෝග මාලාවේ අංක 12 දරන නියෝගය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත අංක 02 ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුත්තේ සත්‍ය මුදල් ගලායාම් සහ සත්‍ය මුදල් ගලා ඒම් පදනම් කරගෙන වුවත්, අරමුදල ඊට පටහැනිව 2019 හා 2020 වර්ෂවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල අයිතම්වල වටිනාකම් අතර වෙනස්කම් පදනම් කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර තිබුණි. තවද ප්‍රමිතයේ අංක 54 හා 55 ඡේද ප්‍රකාරව අඩමාණ ණය වෙන්කිරීම් වටිනාකම මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ජනනය නොවන ක්‍රියාකාරකමක් ලෙස හෙළිදරව් කර නොතිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතය අනුව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | ප්‍රමිත අංක 02 හි ඡේද අංක 08 සහ 56 අනුව භාණ්ඩාගාර බිල්පත් හා ප්‍රති විකුණුම් බිල්පත් ගිණුම්ගත කිරීමේදී 2020 දෙසැම්බර් | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතය අනුව ක්‍රියා කළ යුතුය. |

31 දිනට කල් පිරීමට ඉතිරිව ඇති කාලය මාස 03 හෝ ඊට අඩු ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන ද්‍රවශීල වත්කම් ලෙස පෙන්නුම් කළ යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට මාස 03 ක කාලයක් තුලදී කල් පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් 18 ක එකතු වටිනාකම වූ රු.66,797,498 ක් හා භාණ්ඩාගාර ප්‍රති විකුණුම් (Repo) 02 ක එකතු වටිනාකම වූ රු.6,013,502 ක් මුදල් හා මුදල් සමාන ද්‍රවශීල වත්කම් යටතේ දක්වා නොතිබුණි.

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1996 ඔක්තෝම්බර් 24 දින අංක 946/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 1994 අංක 01 දරන චිත්‍රපට සංස්ථා නියෝග | | | |
| (i) | 2 (4) (I) (ඉ) වගන්තිය | චිත්‍රපටවල උසස් ප්‍රමිතීන් සහතික කිරීම සඳහා, චිත්‍රපට නිෂ්පාදනය කිරීමට සහ ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන උපකරණ සැපයීමට කටයුතු කර නොතිබුණි. | මෙම නියෝග 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කිරීමට අපේක්ෂිතය | ගැසට් නිවේදනයේ නියෝග අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 2 (4) (I) (ඊ) වගන්තිය | චිත්‍රපට කර්මාන්තයේ නියැලී සිටින කලාකරුවන්ට සහ කාර්මික ශිල්පීන්ට ශිෂ්‍යත්ව ලබාදීම හෝ පුහුණු වැඩසටහන් පැවැත්වීමට අරමුදල කටයුතු කර නොතිබුණි. | මෙම නියෝග 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කිරීමට අපේක්ෂිතය | -එම- |
| (iii) | 2 (4) (I) (උ) වගන්තිය | උසස් තත්ත්වයේ කලාත්මක චිත්‍රපට මුළුමනින්ම නිෂ්පාදනය කිරීම සඳහා තිර රචනා ඇගයීමේ කමිටුව විසින් අනුමත කරනු ලැබූ තිර රචනා හෝ එවැනි චිත්‍රපට නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා ලබාගත හැකි ප්‍රභවයකින් විශේෂ උපකරණ කුලියට ලබා ගැනීම පිණිස | මෙම නියෝග 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කිරීමට අපේක්ෂිතය. | ගැසට් නිවේදනයේ නියෝග අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අධ්‍යක්ෂවරුන්ට ණය මුදල් දීම මගින් චිත්‍රපට නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | | |
| (iv) | 2 (4) (I) (ඌ) වගන්තිය | වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් නොකඩවා දේශීය චිත්‍රපට කර්මාන්තයේ නියැලී සිටින සහ චිත්‍රපට දහයකට අඩු නොවන ගණනක එම කටයුතු සම්පූර්ණ කර ඇති වෘත්තීය කාර්මික ශිල්පීන්ට තමන්ගේ නිපුනතා වැඩිකර ගැනීමට සහ දියුණුකර ගැනීමට ණය මුදල් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම නියෝග 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කිරීමට අපේක්ෂිතය | -එම- |
| (v) | 6 (ඇ) වගන්තිය | ණය මුදල් ආපසු ගෙවීම ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා අයවිය යුතු අධිභාර පාලක මණ්ඩලය විසින් නිශ්චය කර අයකර ගත යුතු වුවත්, 2020 වර්ෂය දක්වා සිනමාශාලා හිමියන් වෙත ප්‍රදානය කර තිබූ එකතුව රු 73,548,176.ක ණය මුදල් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම නියෝග 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කිරීමට අපේක්ෂිතය | -එම- |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | 2020 වර්ෂයේ අරමුදලේ වත්කම් සමීක්ෂණයක් සිදුකර සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂිකව සංස්ථාවේ වත්කම් සමීක්ෂණය කිරීමේදී එම මණ්ඩලය මගින් අරමුදලේ වත්කම්ද සමීක්ෂණය කිරීමට කටයුතු කරමි. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ඇතුලත් කල මුදල් රෙගුලාසි 872(2) (ඇ) | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සහතික කළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 08 ක් ප්‍රමාදව 2021 නොවැම්බර් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | පැවති covid – 19 වසංගත තත්ත්වය හමුවේ ආයතනය වසා තැබීමත්, පාලක මණ්ඩල රැස්වීම ප්‍රමාද වීමත් නිසා ගිණුම් ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2015 ඔක්තෝම්බර් 23 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය | 2013 වර්ෂයේදී රජයේ බැංකුවක ආරම්භ කර තිබූ ජංගම ගිණුමක 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.22,643 ක් විය. පූර්ව වර්ෂ විගණන වාර්තාව මඟින්ද පෙන්වා දී තිබූ මෙම අක්‍රීය ජංගම ගිණුම වසා දැමීමට කටයුතු කර නොතිබුණි. | මෙම අක්‍රීය ගිණුම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගත් අතර, ඒ අනුව කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම වසා දැමීමට කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,591,563 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,789,214 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,197,651 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.3,877,556 කින් එනම්, සියයට 92 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | චිත්‍රපට නිෂ්පාදන සහ සිනමාශාලා සඳහා ලබාදී ඇති ණය මුදල් තුළ, වසර 05 සිට වසර 26 දක්වා කාලයක සිට පැවත එන අයකරගත නොහැකි යැයි අරමුදල විසින් ඇස්තමේන්තුගත ණය එකතු වටිනාකම රු.66,958,372 ක් විය. 2020 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම ලබාදී ඇති මුළු ණය ප්‍රමාණයෙන් සියයට 91 ක් විය. ණය ලබාදීමේදී හා අයකර ගැනීමේදී විධිමත්ව හා කාලීනව කටයුතු නොකිරීම නිසා ඉහත ණය ශේෂයන් අයකර ගැනීමට නොහැකිව අඛණ්ඩව හිඟ ණය ශේෂයක් ලෙස ඉදිරියට ගෙනවිත් තිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. ණය කමිටුවක් මඟින් අරමුදලෙන් ලබාදුන් ණය සම්බන්ධයෙන්ද පරීක්ෂා කරන බැවින් කමිටු නිර්දේශ මත කටයුතු කරනු ලැබේ. | මෙම ණය මුදල් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | අරමුදල සතු බැංකු ජංගම ගිණුමේ 2020 වර්ෂය පුරා පැවති මාසික සාමාන්‍ය ශේෂය රු.12,053,864 ක් විය. එම ගිණුමේ වසර පුරා පැවති වාසිදායක ශේෂය ඵලදායී ලෙස කෙටිකාලීනව ආයෝජනය කර අමතර ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සිනමාශාලා සඳහා ණය මුදල් ලබා දීමට මුදල් රඳවා ගන්නා ලද නමුත්, 2020 වසරේදී ණය ඉල්ලුම්පත් ප්‍රමාද වීම මත එම අතිරික්ත මුදල් කෙටිකාලීනව 2021 දී ආයෝජනය කරන ලදී. | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේදී අරමුදල සඳහා පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි. | සකස් කර නොමැත. | අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතුය. |